1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

ISO/IEC 17021 QMS-001-01

| මගේ අංකය / எனது இல. / My Ref. | CSS/7/01/03 | ඔබේ අංකය / உமது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2025.03. 28 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) – 01/2024 (i)

දකුණු පළාත් සභාවේ සියලුම

ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් ,

ගණන් දීමේ නිලධාරීන් වෙත.

**දිගු කලක් තිස්සේ අය කරගත නොහැකිව පවතින රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම යටතේ ලබා දෙන ණය හා අත්තිකාරම් ණය ශේෂ අත්හැර දැමීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2024.07.31 දිනැතිව නිකුත් කර ඇති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - 01/2024 හා බැදේ.

02. බොහෝ රජයේ ආයතන විසින්, දැනට ගිණුම් හා පොත්පත්වලින් ඉවත් කිරීම කළ නොහැකිව පැවති දිගු කාලයක් තිස්සේ අය නොවී පවතින ණය ශේෂ අත්හැර දැමීමට අවශ්‍ය පියවර ගෙන ඇති නමුත්, සමහර රජයේ ආයතනවල ව්‍යුහය අනුව එම කටයුතු අවසන් කර ගැනීම සඳහා තවත් කාලයක් අවශ්‍ය බවට ඉල්ලීම් ඉදිරිපත් වී ඇති බැවින් එම ඉල්ලීම් සැලකිල්ලට ගෙන, 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 හි 04 හා 05 විධිවිධාන සංශෝධනය කරමින් භාණ්ඩාගාර ලේකම් විසින් 2025.01.24 දිනැතිව රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 (I) නිකුත් කර ඇති අතර, දැනට ගිණුම් හා පොත්පත් වලින් ඉවත් කිරීම සිදු කළ නොහැකිව හා දිගු කලක් තිස්සේ අය නොවී පවතින ණය ශේෂ අත්හැර දැමීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා එමගින් 2025.03.31 දක්වා බලය පවරා ඇත.

03. ඒ අනුව 2024.07.31 දිනැති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 01/2024 හි සඳහන් කාල සීමා සංශෝධනය කරනු පිණිස මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. ඒ අනුව වර්ෂ 05 කට වැඩි කාලයක් නිරවුල් නොවී පවතින කිසිදු ශේෂයක් **2025.03.31** දිනෙන් ඔබ්බට ගෙන යාමෙන් වැළකීමට අවශ්‍ය සියලු පියවර ගැනීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් වග බලා ගත යුතු ය. කෙසේ වුව ද, මේ සම්බන්ධයෙන් යම් ගැටළුවක් පවතීනම් පළාත් භාණ්ඩාගාරයේ නිලධාරීන් සමග සාකච්ඡා කර අදාළ ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කළ යුතු ය.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax 091 2246299
විද්‍යුත් තැපැල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

04. එමෙන්ම, එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් අත්හැර දමන ණය ශේෂ පිළිබඳ විස්තර 2025.04.15 දිනට පෙර පළාත් භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්) ට ද පිටපත් සහිතව පළාත් භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂ (මුදල්) වෙත වාර්තා කළ යුතු ය. තවද, 2024.07.31 දිනැතිව නිකුත් කර ඇති ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) 01/2024 හි සඳහන් සෙසු විධිවිධාන එපරිදිම බලපැවැත්වෙන බව වැඩිදුරටත් අවධාරණය කරමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් - 1. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය - දැ.ගැ.පි.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව - දැ.ගැ.පි.
3. අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්), ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත - අ.ක.ස.
4. අධ්‍යක්ෂ (මුදල්), ප්‍රධාන ලේකම් කාර්යාලය, දකුණු පළාත - අ.ක.ස.